## 4. ව්‍යාපාර සංවිධාන

53. එකම පවුලේ සහෝදරයන් තිදෙනෙකු විසින් ඉහළ ගුණත්වයෙන් යුතුව නවීන තාක්ෂණය යොදා ගනිමින් ටින් මාළු නිෂ්පාදනය කිරීම සඳහා "ගුඩ් මැකරල් පෞද්ගලික සමාගම" නමින් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

ඉහත ඉරි ඇඳි පදවලින් විධිමත් සංවිධානයක පොදු ලක්ෂණ පෙන්නුම් කරයි. ඒවා අනුපිළිවෙළින් හා නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) අරමුණක් තිබීම, ආර්ථික කටයුත්තක නියැළීම, ව්‍යාපාර නාමයක් තිබීම, පුද්ගලයන් සමූහයක් සිටීම
(2) පුද්ගලයන් සමූහයක් සිටීම, ව්‍යාපාර නාමයක් තිබීම, අරමුණක් තිබීම, ආර්ථික කටයුත්තක නියැළීම
(3) පුද්ගලයන් සමූහයක් සිටීම, අරමුණක් තිබීම, ආර්ථික කටයුත්ත නියැළීම, ව්‍යාපාර නාමයක් තිබීම
(4) ව්‍යාපාර නාමයක් තිබීම, පුද්ගලයන් සමූහයක් සිටීම, අරමුණක් තිබීම, ආර්ථික කටයුත්තක නියැළීම
(5) ආර්ථික කටයුත්තක නියැළීම, පුද්ගලයන් සමූහයක් සිටීම, අරමුණක් තිබීම, ව්‍යාපාර නාමයක් තිබීම

(………)

- පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ දැකිය හැකි විවිධ ව්‍යාපාර සංවිධාන වේ. ඒ ඇසුරෙන් 54 හා 55 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - පෞද්ගලික සමාගම් B - රාජ්‍ය සංස්ථා

C - කේවල ස්වාමී ව්‍යාපාර D - රාජ්‍ය සමාගම්

E - සමූපකාර F - හවුල් ව්‍යාපාර

54. මේවා අතරෙන් පෞද්ගලික අංශයට අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ග ඇතුළත් පිළිතුර වන්නේ,

(1) A, C, Eහා Fය. (2) A, C, DහාFය. (3) B, D, Eහා Fය.
(4) C, D,Eහා Fය. (5) A, B, Cහා Fය.

(………)

55. රාජ්‍ය අංශයට මෙන්ම පෞද්ගලික අංශයට අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගයකි.

(1) B (2) E (3) D (4) C (5) A

(………)

56. පහත දැක්වෙන්නේ විවිධ ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ කිහිපයකි.

A - තනිව ප්‍රාග්ධනය සපයා ගැනීම.

B - ව්‍යාපාරය නමින් බදු ගෙවීම.

C - සාමූහිකව තීරණ ගැනීම.

D - වගකීම අයිතිකරු දැරීම.

E - ලාභාලාභ තනිව භුක්ති විඳීම.

F - ස්වාධීනව කටයුතු කළ හැකි වීම.

ඉහත ලක්ෂණ අතරෙන් කේවල ස්වාමී ව්‍යාපාරයකට පමණක් අදාළ ලක්ෂණ ඇතුළත් පිළිතුර වන්නේ,

(1) A, B, CහාDය. (2) A, D, Eහා Fය. (3) B, C, Dහා Fය.

(4) C, D, EහාFය. (5) B, C, Eහා Fය.

(………)

57. සුනිල් ප්‍රේමසිරි විසින් "සැපත" නමින් ෆාමසියක් ආරම්භ කර සේවකයින් 6 දෙනෙකුගේ සේවය ලබා ගැනීමට අදහස් කරයි. මෙම ව්‍යාපාරය සම්බන්ධයෙන් බලපාන නීතිරීති ඇතුළත් නිවැරදි පිළිතුරු කාණ්ඩය වන්නේ,

(1) සමාගම් පනත/ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය/ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත/ විශේෂ බලපත්‍ර

(2) හවුල් ව්‍යාපාර ආඥා පනත/ සනීපාරක්ෂක සහතිකය/ සේවක අර්ථසාධක අරමුදල් පනත/ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය

(3) සාප්පු හා කාර්යාල සේවක පනත/ සමාගම් පනත/ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත/හවුල් ව්‍යාපාර ආඥා පනත

(4) ව්‍යාපාර නාම ප්‍රඥප්තිය/ විශේෂ බලපත්‍ර/ සේවක අර්ථ සාධක අරමුදල් පනත/පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත

(5) ව්‍යාපාර නාම ප්‍රඥප්තිය/සමාගම් පනත/පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත/ විශේෂ බලපත්‍ර

(………)

58. හවුල් ඔප්පුවක සඳහන් නොවූ කරුණක් සම්බන්ධයෙන් හෝ හවුල් ඔප්පුවක් නොමැති අවස්ථාවක හවුල් ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් අදාළ කර ගත හැකි පනත වන්නේ,

(1) ව්‍යාපාර නාම ආඥා පනත (2) සමාගම් පනත

(3) හවුල් ව්‍යාපාර ආඥා පනත (4) වාංචා වැළැක්වීමේ ආඥා පනත

(5) සීමිත හවුල් ව්‍යාපාර පනත

(………)

National Institute of Education

59. හවුල් ව්‍යාපාර ක්‍රමයේ වාසි හා අවාසි කිහිපයක් පහත දැක්වේ.

A - අලාභ හවුල්කරුවන් අතර බෙදීයාම.

B - වගකීම අසීමිත වීම.

C - ආරම්භ කිරීමට පහසු වීම.

D - විවිධ කුසලතා ඇති පිරිස් එකතු වීම.

E - නෛතික පුද්ගලභාවයක් නොමැති වීම.

F - ලාභය හවුල්කරුවන් අතර බෙදී යාම.

G - වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම.

ඉහත කරුණු අතරෙන් හවුල් ව්‍යාපාර ක්‍රමයේ වාසි හා අවාසි දැක්වෙන පිළිතුරු කාණ්ඩය වන්නේ,

| | වාසි | අවාසි |
|---|---|---|
| (1) | A,C,D,G | B,E,F |
| (2) | A, B, D,G | C,E,F |
| (3) | B,C,D,E | A,F,G |
| (4) | A,C,F,G | B,D,F |
| (5) | B,D,E,G | A,C,F |

(………)

60. පහත දැක්වෙන්නේ සංස්ථාපිත සමාගම්වලට අදාළ ලක්ෂණ කිහිපයකි.

A - කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකියි.

B - උපරිම කොටස්කරුවන් සංඛ්‍යාව 50 කි.

C - කොටස් හා ණයකර නිකුත් කර ප්‍රාග්ධනය සපයා ගත හැකියි.

D - අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව 01 කි.

E - කොටස්කරුවන්ට ලාභාංශ ගෙවීමට පෙර ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයක් කළයුතු වීම.

පොදු සමාගම් හා පෞද්ගලික සමාගම්වලට අදළ වවෙන වෙන ම ලක්ෂණ දැක්වෙන නිවැරදි පිළිතුරු කාණ්ඩය තෝරන්න.

| | පොදු සමාගම්වල ලක්ෂණ | පෞද්ගලික සමාගම්වල ලක්ෂණ |
|---|---|---|
| (1) | A,CහාE | B හා D |
| (2) | A, B හා C | Dහා E |
| (3) | A,Bහා D | Cහා E |
| (4) | B,Cහා D | A හා E |
| (5) | B,Dහා E | Aහා C |

(………)

61. පහත දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධානවල පවතින විවිධ ලක්ෂණ කිහිපයකි.

A - ලාභ තනිව භුක්ති විඳීම.

B - වගකීම අසීමිතවන අතර කිහිප දෙනෙකු අතර එය බෙදීයාම.

C - සාමූහික ව තීරණ ගැනීමෙන් සාර්ථකත්වයට පැමිණීම.

D - ලාභාලාභ කිහිප දෙනෙකු අතර බෙදීයාම.

E - නෛතික පුද්ගලභාවයක් පැවතීම.

F - සාමාජිකයින් 2 ත් 20 ත් අතර ප්‍රමාණයක් සිටීම.

ඉහත ලක්ෂණ අතරෙන් හවුල් ව්‍යාපාරයකට අදාළ ලක්ෂණ වන්නේ,

(1) B, C, D,F (2) B, D, E,F (3 A, B, C, D

(4) C, D, E,F (5) B, C, D, F

(………)

62. හවුල් ඔප්පුවක් තිබීමෙන් හවුල් ව්‍යාපාරයකට හිමිවන ප්‍රධාන වාසියකි.

(1) ලාභාලාභ බෙදා ගැනීම සම්බන්ධයෙන් ගැටලු පැන නොනැගීම.

(2) හවුල්කරුවන් අතර මත බේද ඇති වීමට තිබෙන ඉඩ කඩ අවම වීම.

(3) ව්‍යාපාරයේ දෛනික කටයුතුවල එක් එක් හවුල්කරුවන් කටයුතු කරන ආකාරය දක්වා තිබීම.

(4) එක් එක් හවුල්කරුවාගේ යුතුකම් හා වගකීම් දක්වා තිබීම.

(5) හවුල් ව්‍යාපාරයේ පරමාර්ථ දක්වා තිබීම.

(………)

63. පහත සඳහන් වන්නේ ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ දී ඉදිරිපත් කළ යුතු ලියවිලි කිහිපයකි.

A - ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය.

B - සාංගමික ව්‍යවස්ථාවලිය.

C - අතුරු ව්‍යවස්ථාවලියේ පිටපත් දෙකක්.

D - ලියාපදිංචිය සඳහා සම්මත වූ මහා සභා රැස්වීමේ වාර්තාවක්.

E - යෝජිත ආර්ථික කටයුතුවල යෝග්‍යතාව දැක්වෙන වාර්තාවක්.

F - ව්‍යවස්ථානුකූල ප්‍රකාශය.

ඉහත ලියවිලි අතරෙන් සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේ දී ඉදිරිපත් කළ යුතු ලියවිලි වන්නේ,

(1) A, B, C, D (2) A, C, D, E (3) A, D, E, F

(4) B, C, D, E (5) C, D, E, F

(………)



National Institute of Education

64. හිරු, සඳු හා තරු හවුල් ව්‍යාපාරයක් කර ගෙන යන නමුත් ලිඛිත හවුල් ගිවිසුමක් නැත. මෙම ව්‍යාපාරය සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) යෙදූ ප්‍රාග්ධන අනුපාතයට අනුව ලාභාලාභ බෙදා ගත යුතුය.
(2) හවුල්කරුවන් ඉටු කරන සේවය වෙනුවෙන් වැටුප් ගෙවිය යුතුය.
(3) කළමනාකරණ කටයුතු සඳහා සහභාගී විය හැක්කේ එක් අයෙකුට පමණි.
(4) හවුල් කරුවන් යොදන අමතර ප්‍රාග්ධනය වෙනුවෙන් 5% ක පොළී ප්‍රතිශතයක් හිමි වේ.
(5) ව්‍යාපාරය වෙනුවෙන් හවුල්කරුවන්ට පෞද්ගලික වියදම් දැරිය නොහැක.

(.........)

65. සීමාසහිත පොදු සමාගමක් සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශ අතරෙන් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.

(1) අවම අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 01ක් වන අතර උපරිමයේ සීමාවක් නැත.
(2) අවම සාමාජිකයින් 02ක් වන අතර උපරිමයේ සීමාවක් නැත.
(3) ලාභාංශ ගෙවීමට පෙර ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයක් කළයුතුවේ.
(4) ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය නොවේ.
(5) සමාගම නමින් බදු ගෙවිය නොහැකිය.

(.........)

66. සමුපකාර ව්‍යාපාරය සම්බන්ධයෙන් අදාළ වන වගන්ති කිහිපයක් පහත දැක්වේ.

A - ස්වාධීන සංවිධානයක් වීම.
B - ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය.
C - සමාජය කෙරෙහි සැලකිලිමත් වීම.
D - එක් සාමාජිකයෙකුට එක් ඡන්දයක් පමණක් හිමි වීම.
E - ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය.
F - ලාභය මූලික අරමුණ නොවීම.

ඉහත ප්‍රකාශ අතරෙන් සමුපකාර ව්‍යාපාරයට පදනම් වූ ලක්ෂණ හා සමුපකාර ප්‍රතිපත්ති වෙන් කර දැක්වෙන පිළිතුර වන්නේ,

| | පදනම් වූ ලක්ෂණ | ප්‍රතිපත්ති |
|---|---|---|
| (1) | A, B, C | D, E, F |
| (2) | A, D, F | B, C, E |
| (3) | B, C, D | A, E, F |
| (4) | D, E, F | A, B, C |
| (5) | A, E, F | B, C, D |

(.........)

National Institute of Education

67. සාංගමික ව්‍යවස්ථාවලියේ අඩංගු කරුණු නිවැරදිව දැක්වෙන කාණ්ඩය තෝරන්න.

(1) සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත දැක්වෙන ප්‍රකාශය/ සමාගමේ ලේකම්වරයාගේ නම/ සමාගමේ පරමාර්ථ

(2) සමාගමේ පරමාර්ථ/ කොටස් හිමියන්ගේ අයිතිවාසිකම්/ සමාගමේ ලේකම්වරයාගේ නම

(3) කොටස්හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම්/ සමාගමේ පරමාර්ථ/ සමාගමේ කළමනාකරණය හා පරිපාලනය

(4) සමාගමේ ප්‍රධාන කාර්යාලයට ළඟාවන මාර්ග සිතියම/ සමාගමේ පරමාර්ථ/ සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත දැක්වෙන ප්‍රකාශය

(5) කොටස් හිමියන්ගේ අයිතිවාසිකම්/ සමාගමේ ප්‍රධාන කාර්යාලයට ළඟාවන මාර්ග සිතියම/ සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත දැක්වෙන ප්‍රකාශය

(.........)

68. පුවත්පතක පළවූ රැකියා ඇබෑර්තු තීරයේ අදාළ ආයතනයේ නම "දැල්කඳුර තේ සමාගම පී.එල්.සී." ලෙස සඳහන් විය. ඉහත සමාගමේ නම නිරීක්ෂණය කිරීමෙන් ඔබට ස්ථිරව එළඹිය හැකි නිගමනය වන්නේ,

(1) කොටස් වෙළෙඳ පොළේ ලියාපදිංචි නොකළ පොදු සමාගමකි.

(2) මහජනයාට ප්‍රසිද්ධියේ කොටස් අලෙවි කළ නොහැකි සමාගමකි.

(3) තේ නිපදවා අපනයනය කරන පොදු සමාගමකි.

(4) ණයකර නිකුත් කර මුදල් රැස් කර ගත් පොදු සමාගමකි.

(5) කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි කරන ලද පොදු සමාගමකි.

(.........)

69. පහත දැක්වෙන්නේ සංස්ථාපිත සමාගම්වල දැකිය හැකි ලක්ෂණ කිහිපයකි.

A - සාමාජික සංඛ්‍යාව 1 - 50 අතර වීම.

B - මහජනයාට කොටස් නිකුත් කර ප්‍රාග්ධනය සපයාගත හැකි වීම.

C - එක් අධ්‍යක්ෂකවරයෙක් අවම වශයෙන් සිටිය යුතු වීම.

D - නිල ලැයිස්තුගත සමාගමක් බවට පත්විය හැකි වීම.

E - නෛතික පුද්ගලභාවයක් පැවතීම.

ඉහත ලක්ෂණවලින් පෞද්ගලික සමාගමකට පමණක් අදාළ වන ලක්ෂණ ඇතුළත් වන්නේ,

(1) A,BහාCපමණි.

(2) A,CහාE පමණි.

(3) B,Cහා D පමණි.

(4) C,D හා Eපමණි.

(5) A,DහාEපමණි.

(.........)

National Institute of Education

70. පහත දැක්වෙන්නේ සංස්ථාපිත සමාගම් 3ක නම් වේ.

A - සීමාසහිත ගුණවර්ධන (පෞද්ගලික) සමාගම

B - සීමාසහිත නෙත්මා සමාගම පී.එල්.සී.

C - සීමාසහිත ආශා ඉන්ටර්නැෂනල් සමාගම

මේ අතරෙන් කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි කර ඇත්තේ,

(1) Bපමණි. (2) Cපමණි. (3) Aහා Cපමණි.

(4) Bහා Cපමණි. (5) A, B, C වේ.

(………)

71. පහත දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධානවල ලක්‍ෂණ කිහිපයකි.

A - ස්වාධීන සංවිධානයක් වීම.

B - ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තිබීම.

C - ලාභ ලැබීමේ අරමුණකින් යුක්ත වීම.

D - ස්වේච්ඡාවෙන් එක් වූ පුද්ගල සමූහයක් සිටීම.

E - වගකීම අසීමිත වීම.

ඉහත ලක්ෂණ අතරෙන් සමූපකාර ව්‍යාපාරයට සුවිශේෂි වූ ලක්‍ෂණ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) A,B,C (2) A,B,D (3) A,C,E (4) B,C,D (5) C,D,E

(………)

72. පහත ප්‍රකාශ අතරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ව්‍යාපාර දාමයේ විවිධ අවස්ථාවල යෙදී සිටින සමාගම් කීපයක් ඒකාබද්ධ වීම තිරස් සංයෝජනය ලෙස හඳුන්වයි.

(2) එකම ගණයේ ව්‍යාපාරවල යෙදී සිටින සමාගම් දෙකක් හෝ කීපයක් ඒකාබද්ධ වීම සිරස් සංයෝජනය ලෙස හඳුන්වයි.

(3) විවිධ භූගෝලීය ප්‍රදේශවල වූ වෙළෙඳ පොළ කටයුතු කරන සමාගම් එකතු වීම ඒකාබද්ධ වීම ලෙස හඳුන්වයි.

(4) වෙන් වෙන්ව ව්‍යාපාර කටයුතු කරන සමාගම් දෙකක් හෝ කිහිපයක් තනි ඒකකයක් බවට පරිවර්තනය වීම අත්පත් කර ගැනීම ලෙස හඳුන්වයි.

(5) එකම ගණයේ නොවන එනම් විවිධ ව්‍යාපාර දාමයන්හි විවිධ අවස්ථාවන්හි යෙදී සිටින ව්‍යාපාර එකට එකතුවීම විෂම සංයෝජනය ලෙස හඳුන්වයි.

(………)

National Institute of Education

73. වරලත් හිමියාට හා වරලත් ලාභියාට ව්‍යාපාර ක්‍රමයෙන් ලැබෙන ප්‍රතිලාභ කිහිපයක් පහත දැක්වේ.

A - විශාල ව්‍යාපාරයකට පිවිසීමට හැකි වීම.

B - අසාර්ථකවීමේ ප්‍රවණතාව අඩු වීම.

C - වරලත් ගිවිසුමට අනුව වගකීම් සපුරාලීම.

D - පුරස්කාරයක් හිමි වීම.

E - මූල්‍ය පහසුකම් ලබාගත හැකි වීම.

F - ව්‍යාපාරය පුළුල් වීම.

ඉහත ප්‍රතිලාභ අතරෙන් වරලත් හිමියාට හා වරලත් ලාභියාට ලැබෙන ප්‍රතිලාභ වෙන වෙනම දක්වා ඇති පිළිතුර වන්නේ,

| | වරලත්හිමියා | වරලත්ලාභියා |
|---|---|---|
| (1) | A, B, C | D, E, F |
| (2) | B, C, D | A, E, F |
| (3) | C, D, E | A, B, F |
| (4) | B, E, F | A, C, D |
| (5) | C, D, F | A, B, E |

(………)

74. X තීරුවෙන් ව්‍යාපාර සංවිධාන කිහිපයක් හා Y තීරුවෙන් ඒ හා සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| X | Y |
|---|---|
| 1. රාජ්‍ය සංස්ථා | A - සෑම සාමාජිකයෙකුටම තමා දරන කොටස් ප්‍රමාණය මත ඡන්ද බලය හිමි වේ. |
| 2. හවුල් ව්‍යාපාර | B - රජයේ සෘජු පාලනයට යටත් වේ. |
| 3. සමුපකාර ව්‍යාපාර | C - පොදු හෝ විශේෂ පාර්ලිමේන්තු පනතක් යටතේ සංස්ථාපිත කරයි. |
| 4. සීමාසහිත පොදු සමාගම් | D - සාමාජිකයෙකුට හිමිවන්නේ එක් ඡන්දයක් පමණි. |
| 5. රාජ්‍ය දෙපාර්තමේන්තු | E - ව්‍යාපාර නාම ප්‍රඥප්තිය බලපායි. |

ඉහත X හා Y ගැළපූ විට අනුපිළිවෙළින් දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

(1) A, B, D, E, C
(2) B, D, C, E, A
(3) C, B, A, E,D
(4) C, E, D, A, B
(5) D, A, C, E, B

(………)

75. අඛණ්ඩ පැවැත්මක් හා සීමාරහිත වගකීමක් ඇති, එහෙත් නෛතික පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර සංවිධානය වන්නේ,

(1) රාජ්‍ය සමාගම් ය.
(2) හවුල් ව්‍යාපාර ය.
(3) රාජ්‍ය දෙපාර්තමේන්තු ය.
(4) කේවල ස්වාමී ව්‍යාපාර ය.
(5) රාජ්‍ය සංස්ථා ය.

(………)

76. පහත "අ" තීරයේ රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර සංවිධාන ද "ආ" තීරයේ ඒවාට නිදසුන් දෙක බැගින් දැක්වේ.

| (අ) | (ආ) |
|---|---|
| 1. රාජ්‍ය සංස්ථා | A - එයාර් ලංකා සමාගම |
| | B - තැපැල් දෙපාර්තමේන්තුව |
| 2. රජයේ දෙපාර්තමේන්තු | C - ලංකා පොස්පේට් සමාගම |
| | D- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම |
| 3. රාජ්‍ය සමාගම් | E - ශ්‍රී ලංකා වරාය අධිකාරිය |
| | F - දුම්රිය දෙපාර්තමේන්තුව |
| | G - ලංකා විදුලි බල මණ්ඩලය |

පිළිවෙළින් (අ)තීරුවට අදාළව (ආ)තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර ලකුණු කරන්න.

(1) D,E, G/ B, F/ A,C
(2) B,E, / A, D, G / C, F
(3) B, G, / A, F / D,E, F
(4) A, B/ D,C/ E, F,G
(5) B, G/ A, F / C,D, E

(………)

77. මුළු ප්‍රාග්ධනයෙන් 51% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් රජය හෝ රජයේ අනුබද්ධිත ආයතනයකට අයිති, සමාගම් පනතට අනුවලියාපදිංචි කොට පවත්වා ගෙන යන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

(1) රාජ්‍ය සංස්ථා
(2) රාජ්‍ය දෙපාර්තමේන්තු
(3) හවුල් ව්‍යාපාර
(4) රාජ්‍ය සමාගම්
(5) පොදු සමාගම්

(………)

# ප්‍රශ්න සඳහා පිළිතුරු පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 5 | 46 | 3 | 91 | 2 | 136 | 2 | 181 | 4 |
| 2 | 1 | 47 | 2 | 92 | 4 | 137 | 2 | 182 | 1 |
| 3 | 3 | 48 | 3 | 93 | 1 | 138 | 3 | 183 | 4 |
| 4 | 3 | 49 | 4 | 94 | 1 | 139 | 5 | 184 | 2 |
| 5 | 2 | 50 | 3 | 95 | 5 | 140 | 5 | 185 | 2 |
| 6 | 3 | 51 | 5 | 96 | 1 | 141 | 3 | 186 | 2 |
| 7 | 3 | 52 | 5 | 97 | 3 | 142 | 3 | 187 | 3 |
| 8 | 4 | 53 | 3 | 98 | 3 | 143 | 2 | 188 | 5 |
| 9 | 3 | 54 | 1 | 99 | 4 | 144 | 2 | 189 | 1 |
| 10 | 4 | 55 | 5 | 100 | 3 | 145 | 4 | 190 | 5 |
| 11 | 2 | 56 | 2 | 101 | 1 | 146 | 3 | 191 | 4 |
| 12 | 1 | 57 | 4 | 102 | 2 | 147 | 2 | 192 | 3 |
| 13 | 3 | 58 | 3 | 103 | 1 | 148 | 2 | 193 | 3 |
| 14 | 1 | 59 | 1 | 104 | 5 | 149 | 5 | 194 | 3 |
| 15 | 3 | 60 | 1 | 105 | 2 | 150 | 4 | 195 | 2 |
| 16 | 1 | 61 | 1 | 106 | 5 | 151 | 1 | 196 | 5 |
| 17 | 3 | 62 | 2 | 107 | 4 | 152 | 4 | 197 | 1 |
| 18 | 5 | 63 | 2 | 108 | 2 | 153 | 3 | 198 | 1 |
| 19 | 2 | 64 | 4 | 109 | 2 | 154 | 4 | 199 | 1 |
| 20 | 3 | 65 | 3 | 110 | 2 | 155 | 4 | 200 | 4 |
| 21 | 4 | 66 | 2 | 111 | 2 | 156 | 2 | 201 | 1 |
| 22 | 1 | 67 | 3 | 112 | 3 | 157 | 1 | 202 | 5 |
| 23 | 5 | 68 | 5 | 113 | 4 | 158 | 2 | 203 | 5 |
| 24 | 4 | 69 | 2 | 114 | 2 | 159 | 1 | 204 | 4 |
| 25 | 4 | 70 | 1 | 115 | 1 | 160 | 5 | 205 | 5 |
| 26 | 4 | 71 | 2 | 116 | 1 | 161 | 2 | 206 | 1 |
| 27 | 5 | 72 | 5 | 117 | 4 | 162 | 2 | 207 | 5 |
| 28 | 2 | 73 | 5 | 118 | 5 | 163 | 3 | 208 | 2 |
| 29 | 4 | 74 | 4 | 119 | 4 | 164 | 2 | 209 | 2 |
| 30 | 1 | 75 | 3 | 120 | 2 | 165 | 5 | 210 | 4 |
| 31 | 2 | 76 | 1 | 121 | 3 | 166 | 4 | 211 | 5 |
| 32 | 1 | 77 | 4 | 122 | 1 | 167 | 2 | 212 | 2 |
| 33 | 3 | 78 | 3 | 123 | 5 | 168 | 3 | 213 | 3 |
| 34 | 1 | 79 | 4 | 124 | 5 | 169 | 3 | 214 | 5 |
| 35 | 1 | 80 | 3 | 125 | 2 | 170 | 5 | 215 | 2 |
| 36 | 4 | 81 | 4 | 126 | 4 | 171 | 5 | 216 | 5 |
| 37 | 4 | 82 | 2 | 127 | 2 | 172 | 5 | 217 | 3 |
| 38 | 1 | 83 | 3 | 128 | 3 | 173 | 5 | 218 | 2 |
| 39 | 1 | 84 | 3 | 129 | 4 | 174 | 1 | 219 | 4 |
| 40 | 3 | 85 | 2 | 130 | 3 | 175 | 1 | 220 | 5 |
| 41 | 2 | 86 | 4 | 131 | 2 | 176 | 5 | 221 | 2 |
| 42 | 3 | 87 | 3 | 132 | 3 | 177 | 1 | 222 | 4 |
| 43 | 2 | 88 | 2 | 133 | 4 | 178 | 3 | 223 | 3 |
| 44 | 2 | 89 | 4 | 134 | 4 | 179 | 4 | 224 | 2 |
| 45 | 1 | 90 | 5 | 135 | 5 | 180 | 5 | 225 | 4 |

National Institute of Education

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| 226 | 1 | 251 | 4 | 276 | 3 | 301 | 2 | 326 | 1 |
| 227 | 5 | 252 | 4 | 277 | 2 | 302 | 5 | 327 | 1 |
| 228 | 2 | 253 | 1 | 278 | 3 | 303 | 4 | 328 | 2 |
| 229 | 5 | 254 | 5 | 279 | 5 | 304 | 3 | 329 | 4 |
| 230 | 5 | 255 | 3 | 280 | 2 | 305 | 3 | 330 | 1 |
| 231 | 2 | 256 | 5 | 281 | 4 | 306 | 2 | 331 | 3 |
| 232 | 1 | 257 | 5 | 282 | 3 | 307 | 3 | 332 | 1 |
| 233 | 2 | 258 | 4 | 283 | 4 | 308 | 5 | 333 | 4 |
| 234 | 5 | 259 | 5 | 284 | 4 | 309 | 3 | 334 | 1 |
| 235 | 2 | 260 | 3 | 285 | 2 | 310 | 3 | 335 | 3 |
| 236 | 3 | 261 | 4 | 286 | 4 | 311 | 5 | 336 | 2 |
| 237 | 4 | 262 | 3 | 287 | 3 | 312 | 3 | 337 | 5 |
| 238 | 4 | 263 | 2 | 288 | 1 | 313 | 1 | 338 | 1 |
| 239 | 3 | 264 | 1 | 289 | 2 | 314 | 1 | 339 | 3 |
| 240 | 2 | 265 | 2 | 290 | 2 | 315 | 1 | 340 | 3 |
| 241 | 4 | 266 | 2 | 291 | 4 | 316 | 1 | 341 | 5 |
| 242 | 4 | 267 | 3 | 292 | 1 | 317 | 4 | 342 | 2 |
| 243 | 3 | 268 | 3 | 293 | 1 | 318 | 5 | 343 | 1 |
| 244 | 5 | 269 | 1 | 294 | 5 | 319 | 2 | 344 | 5 |
| 245 | 2 | 270 | 3 | 295 | 4 | 320 | 3 | 345 | 2 |
| 246 | 4 | 271 | 5 | 296 | 2 | 321 | 3 | 346 | 3 |
| 247 | 5 | 272 | 3 | 297 | 3 | 322 | 2 | 347 | 3 |
| 248 | 3 | 273 | 4 | 298 | 3 | 323 | 2 | 348 | 2 |
| 249 | 3 | 274 | 5 | 299 | 2 | 324 | 3 | 349 | 1 |
| 250 | 3 | 275 | 1 | 300 | 4 | 325 | 4 | 350 | 3 |

National Institute of Education

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."